සලාත් ඉටු කරන්නෙකු ඉදිරිපිටින් ගමන් කරන පුද්ගලයා තමා දරන වරදෙහි තරම දැන සිටියේ නම්, ඔහු ඉදිරියෙන් ගමන් කිරීමට වඩා හතළිහක් සිටගෙන සිටීම ඔහුට උතුම් වනු ඇත.”

බුස්ර් ඉබ්නු සඊද් තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: 'සැබැවින්ම සෙයිද් ඉබ්නු කාලිද් අල්-ජුහයිනී (රළියල්ලාහු අන්හු) තුමා තමන්ව අබූ ජුහයිම් (රළියල්ලාහු අන්හු) තුමා වෙත යැවී ය. "එය සලාත් ඉටු කරන කෙනෙකු ඉදිරියෙන් ගමන් කරන්නා ගැන නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් විසින් පවසා ඇති දෑ කුමක් දැ?"යි ඔහු සවන් දුන් දෑ ඔහුගෙන් විමසා සිටිනු පිණිස ය. එවිට අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ ජුහෙයිම් තුමා මෙසේ පවසා සිටියේය:
"සලාත් ඉටු කරන්නෙකු ඉදිරිපිටින් ගමන් කරන පුද්ගලයා තමා දරන වරදෙහි තරම දැන සිටියේ නම්, ඔහු ඉදිරියෙන් ගමන් කිරීමට වඩා හතළිහක් සිටගෙන සිටීම ඔහුට උතුම් වනු ඇත.” අබු අන්-නද්ර් මෙසේ පැවසීය: 'එතුමාණන් දින මාස හෝ අවුරුදු හතළිහක් කීවාදැ?යි මම නොදනිමි' යැයි පවසා සිටියේය. [صحيح] [متفق عليه]

අනිවාර්යය සලාත් හෝ අතිරේක සලාත් ඉටු කරන්නෙකු ඉදිරිපිටින් ගමන් කිරීම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දැඩි සේ අවවාද කර ඇත්තාහ. උවමනාවෙන්ම එසේ සිදු කරන පුද්ගලයා තමාට අත්වන පාපයේ තරම දැන සිටියේ නම්, ඔහු (දින, මාස, අවුරුදු) හතළිහක් සිටගෙන සිටීම ඔහුට උතුම් වනු ඇත. එය ඔහු ඉදිරියෙන් ගමන් කිරීමට වඩා එය ඔහුට ශේර්ෂ්ටය. මෙම හදීසය වාර්තා කරන අබූ අන්-නළ්ර් තුමා මෙසේ පවසයි: 'දින හතළිහක් ද මාස හතළිහක් ද එසේ නැතහොත් වසර හතළිහක් ද යන්න ගැන මම නොදනිමි.'

http://sunnah.global/hadeeth/si/show/7191